# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2374/28 - 2024 මාර්තු මස 07 වැනි බ්‍රහස්පතින්දා - 2024.03.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2017 අංක 4 දරන ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව පනත

2017 අංක 4 දරන ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව පනතේ 39 වන වගන්තිය යටතේ ඉංජිනේරුවරුන්ගේ සභාව විසින් සාදන ලද රීති.

තිලක් ද සිල්වා,
සභාපති,

2024 පෙබරවාරි 28 වැනි දින,
ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව,
කොළඹ දී ය.

රීතිය

**රීති අංක: 1/2024**

1. මෙම රීතිය විදුලි කාර්මිකයකු ලෙස ඊට අදාළ කටයුතුවල නියැලීම සම්බන්ධයෙන් හා සුදුසුකම් ලත් විදුලි කාර්මිකයකු ලෙස ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ ඉංජිනේරු කාර්මිකයකු ලෙස ලියාපදිංචි කිරීමේ රීතිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

විදුලි කාර්මිකයෙකු ලෙස ඊට අදාළ කටයුතුවල නියැලීම සම්බන්ධයෙන් හා සුදුසුකම් ලත් විදුලි කාර්මිකයෙකු ලෙස ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ ඉංජිනේරු කාර්මික වශයෙන් ලියාපදිංචි කිරීම.

02. 2026 ජනවාරි 01 දින සිට 2029 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ විදුලි කාර්මිකයෙකු ලෙස එයට අදාළ කටයුතුවල නියැලීමට ජාතික වෘත්තීය නිපුණතා සුදුසුකම 3 න මට්ටම (NVQ Level 3) අවම සුදුසුකම ලෙස තිබීම අනිවාර්ය වේ.

03. 2030 ජනවාරි 01 දිනෙන් පසුව, විදුලි කාර්මික ලෙස ඊට අදාළ කටයුතුවල නියැලීමට අවම වශයෙන් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබීම අනිවාර්ය වේ.

- ජාතික වෘත්තීය නිපුණතා සුදුසුකම 4 මට්ටම. (NVQ Level 4)
- ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ ලියාපදිංචි වීම.

ශ්‍රී ලංකාවේ විදුලි ඉංජිනේරු ක්ෂේත්‍රය තුළ විදුලි කාර්මික ශිල්පයේ ප්‍රමිතීන් ඉහළ නැංවීම. ප්‍රවේසම සහතික කිරීම සහ ඉහළම වෘත්තීය මට්ටම පවත්වා ගෙන යෑම සඳහා එම වෙනස්කම් සිදුකර ඇත.

EOG 03 - 0050

1A - PG 6667 — 09 (2024/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*